© සියලු ම හිමිකම් ඇවිරිණි අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමය

## ශිල්පීය අදියර
## 2008 සැප්තැම්බර් විභාගය

| | | | |
|---|---|---|---|
| විභාග දිනය | : 2008 සැප්තැම්බර් 20 | පිටු ගණන | : 06 |
| විභාග වේලාව | : පෙ.ව. 9.30 - ප.ව. 12.30 | ප්‍රශ්න ගණන | : 06 |

අයදුම්කරුවන්ට උපදෙස්:
1. නියමිත කාලය පැය 3 කි.
2. සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| මූලික මූල්‍ය ගිණුම්කරණය | (FAF / 501) |

---

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 15)*

(අ) (i) සංගතතා මූලධර්මයෙහි සහ (ii) සීහුම් මූලධර්මයෙහි තේරුම, කෙටියෙන් සඳහන් කර, ගිණුම්කරණයේ දී සහ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී එම මූලධර්ම මූලිකව වැදගත් වන්නේ මක්නිසාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ආ) සීමිත PQ (පුද්) සමාගමේ පොත්තබන්නා හැටියට 2008 පෙබරවාරි 01 වන දින ඔබ පත් වේ. ජනවාරි මාසයේ පහත සඳහන් මුළු එකතු වශයෙන් සපයා ඇති තොරතුරු අනුව එම මාසයේ ගැනුම් ලෙජර පාලන ගිණුම සහ විකුණුම් ලෙජර පාලන ගිණුම ද සකස් කරන්න. පාලන ගිණුම් දෙකම ප්‍රධාන ලෙජරයේ පවත්වා ගනු ඇත.

| 2008 ජනවාරි | | රු. |
|---|---|---|
| 1 | ගැනුම් ලෙජර ශේෂයන්ගේ එකතුව | 25,500 |
| 1 | විකුණුම් ලෙජර ශේෂයන්ගේ එකතුව | 51,400 |
| 31 | මාසයේ ණයට මිලට ගැනුම් | 31,600 |
| 31 | මාසයේ ණයට විකුණුම් | 61,800 |
| 31 | මාසය තුළ ආපසු එවුම් | 1,900 |
| 31 | මාසය තුළ ගනුදෙනුකරුවන්ට දුන් ප්‍රතිභාග (විකුණූ භාණ්ඩවල මිල ඌනතාවය වෙනුවෙන්) | 1,000 |
| 31 | මාසය තුළ සැපයුම්කරුවන්ට ගෙවූ මුදල් | 20,100 |
| 31 | ලද වට්ටම් | 1,000 |
| 31 | මාසය තුළ ගනුදෙනුකරුවන්ගෙන් ලද මුදල් | 41,400 |
| 31 | මාසය තුළ බොල්ණය කපාහැරීම් | 3,100 |

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

**ප්‍රශ්න අංක 02** *(ලකුණු 23)*

(අ) සීමිත XY (පුද්) සමාගම 2008 ජනවාරි 01 වන දින තම සමාගමේ රු.10 බැගින් වන සාමාන්‍ය කොටස් 50,000 ක නිකුතුවක් එකක් රු.2 ක අධි මිලට නිකුත් කරන ලද අතර කොටස් ලබා ගැනුම සඳහා අයදුම්කරුවන් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතු වේ.

| | |
|---|---|
| අයැදුම් මුදල | රු.5 (රු.2 අධිමිල සමඟ) |
| විභාජන මුදල | රු.4 |
| ඇරයුම් මුදල | රු.3 |

2008 ජනවාරි සහ පෙබරවාරි මස තුළ දී කොටස් 60,000 ක් සඳහා අයදුම්පත් ලැබී තිබූ අයැදුම් කළ සියල්ලන්ටම අනු ප්‍රමාණයෙන් කොටස් නිකුත් කරන ලදී.

අතිරික්තව ලැබුණු අයැදුම් මුදල්, විභාජන මුදල් වෙනුවෙන් ගෙවිය යුතු මුදල්වලට හිලව් කර ඇත.

කොටස් විභාජනය කිරීමට පසු ලැබිය යුතු ඇරයුම් මුදල්, කොටස් 1,000 කට හැර අනිකුත් කොටස් වෙනුවෙන් ලැබිණි.

මෙම ගනුදෙනු වෙනුවෙන් ගණන් තැබීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන් ඊට අදාළ විස්තරය සමඟ ඉදිරිපත් කරන්න. එසේ කිරීමේ දී බැංකු හෝ මුදල් ගිණුම් සටහන් ද අදාළ වේ. **(ලකුණු 08)**

(ආ) සීමිත රිච්කේක් බේකර්ස් සමාගම 2007 වර්ෂය වෙනුවෙන් කෙටුම්පත් ගිණුම් සකස් කළ පසු දක්වුනු ගිණුම් ශේෂයන්, 2007 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමක් ලෙස පහත දක්වේ.

| | රු. |
|---|---|
| මෙම සමාගමේ අනුදත් ප්‍රාග්ධනය | |
| - රු. 10 බැගින් 8% වරණීය කොටස් 10,000 | 100,000 |
| - රු. 10 බැගින් වන සාමාන්‍ය කොටස් 20,000 | 200,000 |
| | 300,000 |

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| නිකුත් කළ ප්‍රාග්ධනයඃ | | |
| 6,000 8% වරණීය කොටස් (රු.10) | | 60,000 |
| 12,000 සාමාන්‍ය කොටස් (රු.10) | | 120,000 |
| සාමාන්‍ය කොටස් අධිමිල ගිණුම | | 10,000 |
| පොදු සංචිතය | | 50,000 |
| ලාභ අලාභ ගිණුමේ 2007 ජන. 01 දිනට ශේෂය | | 22,730 |
| වර්ෂයේ ලාභය - 2007.12.31 දිනට | | 86,600 |
| පරිශ්‍ර දේපල (පිරිවැය රු.120,000) | 100,000 | |
| මුළුතැන්ගෙයි උපකරණ (ක්ෂය ප්‍රතිපාදන රු.3,500 ක් අඩුව) | 115,000 | |
| ණයහිමියෝ | | 29,960 |
| ආරම්භක වියදම් | 2,200 | |
| අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව මත තොග | 57,960 | |
| ණයගැතියෝ (රු.16,710 බොල්ණය ප්‍රතිපාදන අඩුව) | 83,290 | |
| 10% ණයකර | | 40,000 |
| ලී භාණ්ඩ සහ සවිකිරීම් (ක්ෂය ප්‍රතිපාදන රු.1,410 ක් අඩුව) | 3,640 | |
| බැංකු ශේෂය | 53,000 | |
| අතැති මුදල් | 4,200 | |
| | 419,290 | 419,290 |

අධ්‍යක්ෂවරුන් පහත සඳහන් තීරණ ගෙන ඇත.

(i) ප්‍රාරම්භක වියදම් ලාභයෙන් කපා හැරීමට

(ii) පොදු සංචිතය රු. 75,000 දක්වා වැඩි කිරීමට

(iii) වරණීය කොටස්කරුවන්ට වර්ෂයේ ලාභාංශ ගෙවීමට සහ සාමාන්‍ය කොටස්කරුවන් සඳහා 15% ක ලාභාංශ ගෙවීමට

මේ කරුණු අනුව, සමාගමේ

අ) 2007.12.31 න් අවසන් වසර සඳහා ලාභාලාභ විසර්ජන ගිණුම ද, **(ලකුණු 05)**

ආ) අභ්‍යන්තර කාර්යයන් සඳහා සමාගමේ 2007.12.31 දිනට ශේෂ පත්‍රය ද සකසන්න. **(ලකුණු 10)**

**(මුළු ලකුණු 23)**

**ප්‍රශ්න අංක 03** *(ලකුණු 17)*

නීල් සහ ක්ලවුඩ් නිල්වලා හෝටලයේ අයිතිකරුවෝ වෙති. 2007.12.31 දිනට වෙළඳ ගිණුම සකස් කිරීමෙන් පසු ඔවුන්ගේ හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | රු. | රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය - නීල් | | 35,000 |
| - ක්ලවුඩ් | | 30,000 |
| ගැනිලි - නීල් | 2,000 | |
| - ක්ලවුඩ් | 4,000 | |
| ජංගම ගිණුම - නීල් | 250 | |
| - ක්ලවුඩ් | | 100 |
| වෙළඳ ගිණුම දළ ලාභය | | 60,790 |
| වේතන හා වැටුප් | 22,760 | |
| තැන්පතු (කල්තබා වෙන් කිරීම් වෙනුවෙන්) | | 750 |
| වෙළෙඳ ණයහිමියෝ | | 4,330 |
| ඉන්ධන හා විදුලිය | 4,840 | |
| පරිශ්‍ර දේපල (බද්ද මත) | 50,000 | |
| බැංකුවේ මුදල් ශේෂය | 22,710 | |
| අතැති මුදල් | 330 | |
| අලුත්වැඩියා හා ආදේශ මුදල් | 1,870 | |
| පිඟන් සහ මේස උපකරණ | 4,500 | |
| ලද වට්ටම් | | 780 |
| ණයගැතියෝ | 2,270 | |
| ලී භාණ්ඩ හා සවිකිරීම් | 6,800 | |
| වෙළෙඳ ප්‍රචාරණ ගාස්තු | 2,510 | |
| බොල්ණය | 390 | |
| ණය ගිණුම - ක්ලවුඩ් | | 5,000 |
| වරිපනම් ගාස්තු | 3,350 | |
| ලොන්ඩ්‍රි ගාස්තු | 2,220 | |
| තැපැල් හා දුරකතන ගාස්තු | 1,840 | |
| රක්ෂණ වියදම් | 610 | |
| තොගය | 3,500 | |
| | 136,750 | 136,750 |

පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්න.

(i) උපචිත වැටුප් රු.190/- ක් වේ.

(ii) වෙළෙඳ ප්‍රචාරණ රු.510/- අත්තිකාරම් ගෙවීමකි.

(iii) ණයගැති ශේෂයෙන් රු.170/- ක් නිසැකවම නොලැබෙන්නේ ය.

(iv) ක්ෂය ප්‍රතිපාදන පහත දැක්වෙන අන්දමට සලස්වන්න.
- ලී භාණ්ඩ හා සවිකිරීම් - වාර්ෂික 10%
- බදු මත පරිශ්‍ර දේපල - වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදන රු.8,000 යි.
- පිඟන් භාණ්ඩ හා මේස උපකරණ රු.2,400/- කට නැවත අගය කරන ලදී.

(v) ක්ලවුඩ්ගේ ණය මුදලට - වාර්ෂිකව 5% පොලියක් හිමි ය.

(vi) හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත සඳහන් ප්‍රතිපාදන සැලකිල්ලට ගන්න.
- හවුල්කරුන්ට ප්‍රාග්ධනයට වාර්ෂික පොලිය 4% ක් හිමි ය.
- ඔවුන්ගේ ගැනිලි ගිණුමේ ශේෂය මත 10% පොලියකට යටත් ය.
- නීල්ට ශුද්ධ ලාභයෙන් 10% ක වැටුපක් හිමි වේ.

(vii) නීල් සහ ක්ලවුඩ්ට ශුද්ධ ලාභය - 5:4 අනුපාතයෙන් බෙදී යයි.

මේ කරුණු අනුව,

(අ) ව්‍යාපාරයේ 2007.12.31 න් අවසන් වසර සඳහා ලාභාලාභ ගිණුම ද, **(ලකුණු 07)**

(ආ) 2007.12.31 න් අවසන් වසර සඳහා ලාභාලාභ විසර්ජන ගිණුම ද, **(ලකුණු 05)**

(ඇ) 2007.12.31 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් ද සකසන්න. **(ලකුණු 05)**

**(මුළු ලකුණු 17)**

**ප්‍රශ්න අංක 04** *(ලකුණු 18)*

(1) කරෝලිස් සහ පුත්‍රයෝ මුළුතැන්ගෙයි උපකරණ නිෂ්පාදනය කරති. 2007 දෙසැම්බර් 31 දිනට ඔවුන්ගේ ගිණුම් පොත් අනුව පහත සඳහන් ශේෂයන් දැක්විණ.

| | **රු.'000** |
|---|---|
| කාර්යාල වැටුප් | 130 |
| කර්මාන්තශාලා වේතන | 6,500 |
| කර්මාන්තශාලා අධීක්ෂක වැටුප් | 300 |
| ගෙවල් කුලී සහ වරිපනම් | 1,200 |
| විදුලිය | 3,000 |
| කාර්යාල ගොඩනැගිලි අලුත්වැඩියාව | 600 |
| පිරියත හා යන්ත්‍ර අලුත්වැඩියාව | 1,000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 20,000 |
| ගෙනඒමේ කුලී | 1,200 |
| අමුද්‍රව්‍ය ආනයන වියදම් | 40 |
| අනිකුත් ප්‍රවාහන වියදම් | 400 |
| පිරියත සහ යන්ත්‍ර (ක්ෂය කළ වටිනාකම) | 75,000 |
| කර්මාන්තශාලා සම්බන්ධ වැලඩින් ගාස්තු | 60 |

ආරම්භක හා වර්ෂ අවසාන තොග වටිනාකම් පහත දැක්වේ.

| | **2007.01.01** | **2007.12.31** |
|---|---|---|
| | **රු.'000** | **රු.'000** |
| අමුද්‍රව්‍ය | 1,200 | 2,000 |
| නිමි භාණ්ඩ | 350 | 450 |
| නොනිමි භාණ්ඩ | 600 | 900 |

අදාළ අනෙකුත් තොරතුරුඃ

(i) ගෙවල් කුලී සහ වරිපනම් - ගෙවල් කුලී රු.400 ක් කාර්යාල සඳහා විය. වරිපනම් ගාස්තු කර්මාන්තශාලා පරිශ්‍රය වෙනුවෙනි.

(ii) පිරියත සහ යන්ත්‍ර ක්ෂය කළ වටිනාකමෙන් 10% ක්ෂය ප්‍රතිපාදන කළ යුතු ය.

(iii) විදුලිය ගාස්තු - කාර්යාලයට 1/5 සහ කර්මාන්තශාලා 4/5 අනුපාතයෙනි.

(iv) සමහර භාණ්ඩ නිපදවීමේ දී කර්මාන්තශාලාවට බාහිරින් වැල්ඩින් කළ යුතු වේ.

(v) අනෙකුත් ප්‍රවාහන ගාස්තු කාර්යාල කාර්යය මණ්ඩලයේ ප්‍රවාහනය සඳහා ය.

අවශ්‍යවන්නේඃ 2007 දෙසැම්බර් 31 න් අවසන් වසරට නිෂ්පාදන ගිණුම සකසන්න. **(ලකුණු 10)**

(2) මයිකල් පෙරේරා මහතා, මයිකල් පෙරේරා සහ සමාගම යනුවෙන් ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි. 2008 මාර්තු මස බැංකු ගිණුම් ප්‍රකාශය ලද විට එහි ශේෂය රු. 3,360 ක අයිරාවක් විය. මුදල් පොතේ ශේෂය රු. 3,000 ක් විය. එය මුදල් පොත හා සසඳන විට පහත දැක්වෙන කරුණු හෙළි විය.

(i) 2008 මාර්තු 29 සහ 30 දින තැන්පත් කරන ලද පහත දැක්වෙන චෙක්පත්වල මුදල් උපලබ්ධි වී නොතිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| චෙක්පත් අංක | 467301 | - ඒ. සැම්සන්ගෙන් ලද | රු. 5,650 | |
| | 987256 | - එල්. ජයනෙත්තිගෙන් ලද | රු. 7,890 | |
| | 637862 | - එල්. සෝමපාලගෙන් ලද | <u>රු. 3,200</u> | රු. 16,740 |

(ii) 2008 මාර්තු මස නිකුත් කරන ලද පහත දැක්වෙන චෙක්පත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් වී නොතිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| චෙක්පත් අංක | 365322 | - කේ. ජයවර්ධනට නිකුත් කළ | රු. 3,265 | |
| | 365327 | - ටී. ලියනගේට නිකුත් කළ | රු. 6,500 | |
| | 365463 | - ශ්‍රී ලංකා ටෙලිකොම් නිකුත් කළ | <u>රු. 13,135</u> | රු. 22,900 |

(iii) එස්. ජිනසේනගෙන් ලද රු. 750 ක චෙක්පත් තැන්පත් කරන ලදුව මාර්තු 28 දින අගරු වී ආපසු ලැබුණ ද මුදල් පොතේ ඒ වෙනුවෙන් සටහනක් නොතිබුණි.

(iv) එල්.බී. ෆිනෑන්ස් වෙතින් රු.4,500 ලාභාංශ චෙක්පතක් බැංකු ගිණුමට කෙලින්ම බැර කර තිබුණි.

(v) මාර්තු 31 දින බැංකු ප්‍රකාශයේ අයිරා පොලී රු.4,500 ක් ද, බැංකු ගාස්තු රු.950 ක් ද ගිණුමට හර කර තිබුණි.

(vi) මාර්තු 31 දින නිකුත් කළ චෙක්පතක රු.5,800 ක මුදල රු.8,500 ක් ලෙස මුදල් පොතේ සටහන් වී තිබුණි.

(vii) මයිකල් පෙරේරා නමට වූ රු.4,000 ක චෙක්පතක්, මයිකල් පෙරේරා සමාගමේ ගිණුමට මාර්තු මස බැර වී තිබුණි. පෙරේරා මහතා තම පුද්ගලික බැංකු ගිණුම ද එකම බැංකු ශාඛාවේ පවත්වයි.

(viii) පිටුවකින් පිටුවකට ඉදිරියට ගෙන ඒමේ දී සිදු වූ වරදකින් මුදල් පොතේ ගෙවීම් එකතුව රු.200 ක් අඩුවෙන් සටහන් වී ඇත. (රු.20,800 ක් වූ පිටුවක එකතුව රු.20,600 ක් ලෙස ඉදිරියට ගෙන ඒම)

බැංකු ප්‍රකාශය සමග මුදල් පොතේ ශේෂය සැසඳීම සඳහා

(a) මුදල් පොතේ ගැලපුමක්, සහ **(ලකුණු 05)**

(b) 2008 මාර්තු 31 දින බැංකු සැසඳුම් ප්‍රකාශය ද සකස් කරන්න. **(ලකුණු 03)**

**(මුළු ලකුණු 18)**

**<u>ප්‍රශ්න අංක 05</u>** *(ලකුණු 14)*

ජේස්සෙටර්ස් ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් 1,500 කි. වාර්ෂික සාමාජික ගාස්තුව රු.500 කි. 2007.01.01 දිනට සාමාජිකයින් 100 ක් 2006 වසරට සාමාජික ගාස්තු ගෙවා නොතිබුණු අතර සාමාජිකයින් 10 දෙනෙකු 2007 වසරේ සාමාජික ගාස්තුව ද කල්තියා ගෙවා තිබිණි. කෙසේ වෙතත් 2007.12.31 දිනට සාමාජිකයින් 90 ක් පමණක් 2007 වසරට සාමාජික ගාස්තු නොගෙවා තිබිණි. මේ අතර සාමාජිකයින් 80 ක් 2008 වසරට ද කල්තබා තම සාමාජික ගාස්තු ගෙවා තිබුණි.

භාණ්ඩාගාරික පහත දක්වෙන ලැබීම් සහ ගෙවීම් ගිණුම සකසා තිබිණි.

| | හර<br>රු.'000 | බැර<br>රු.'000 |
|---|---|---|
| 2007.01.01 දිනට බැංකු ශේෂය | | 125 |
| ලැබීම්: | | |
| සාමාජික ගාස්තු | | 790 |
| පරිත්‍යාග | | 185 |
| ගෙවීම්: | | |
| ගෙවල් කුලී | 155 | |
| විදුලි ගාස්තු | 28 | |
| දුරකතන | 30 | |
| ජල සැපයුම් බිල්පත් | 4 | |
| කාර්යාල වැටුප් | 420 | |
| සේ.අ.අ. සහ සේ.නි.භා.අ. | 40 | |
| ක්‍රීඩා භාණ්ඩ මිලට ගැනුම් | 50 | |
| සාමාජික සුභසාධක වියදම් | 12 | |
| ස්ථාවර තැන්පතු | 100 | |
| මරණාධාර පරිත්‍යාග | 18 | |
| ණය ගෙව්වා පොලී සමග | 75 | |
| ක්‍රීඩාගාරය ඉදිකිරීම | 85 | |
| 2007.12.31 දිනට ශේෂය | 83 | |
| | 1,100 | 1,100 |

පහත දැක්වෙන තොරතුරු සැළකිල්ලට ගන්න.

| | 2007.01.01 | 2007.12.31 |
|---|---|---|
| අනෙකුත් උපචිත වියදම් | 5,000 | 7,000 |
| උපචිත ගෙවල් කුලී | 12,000 | 6,000 |
| උපචිත දුරකතන | 3,000 | 4,000 |
| අනෙකුත් වත්කම් හා බැරකම් | | |
| මෝටර් වාහන | 145,000 | 125,000 |
| ස්ථාවර තැන්පතු | 250,000 | 350,000 |
| බැංකු ණය | 150,000 | 90,000 |

අවශ්‍යවන්නේ:

(අ) 2007.12.31 දිනට ක්‍රීඩා සමාජයේ සමුච්චිත අරමුදල ගණනය කරන්න. **(ලකුණු 04)**

(ආ) 2007 වසරට ආදායම් වියදම් ගිණුම පිළියෙල කරන්න. **(ලකුණු 10)**

**(මුළු ලකුණු 14)**

**<u>ප්‍රශ්න අංක 06</u>** *(ලකුණු 13)*

(අ) සමාගම් පනත අනුව ප්‍රසිද්ධ සමාගමක් පවත්වා ගත යුතු රෙජිස්ටර් සහ ලේඛන පහක් සඳහන් කර, ඒවා හඳුන්වා දීම හෝ අවශ්‍යම කරුණු විස්තර කරන්න. **(ලකුණු 10)**

(ආ) සුළු මුදල් අග්‍රිමය යනු කුමක් දැයි එහි ප්‍රයෝජන ද දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 03)**

**(මුළු ලකුණු 13)**

***ප්‍රශ්න පත්‍රය අවසානයි***